


No.11/9 Rosita Housing scheme Kotagala- Email:- mpa.arangam@gmail.com

**නුවරඑළිය දිස්ත්‍රික්කයට ප්‍රාදේශීය ලේකම් කාර්යාල ලබා දීමේ දී සිදු කරනු ලැබූ අවතක්සේරුව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම දැනුවත් කිරීම සම්බන්ධයෙන් පෙත්සන් අත්කිරීමේ ජාතික ව්‍යාපාරය.**

**අගනුවර - කොළඹ දී**

..................................................
..................................................
..................................................
හිතවතුණි,

01. 2019 ඔක්තෝබර් මස 29 වනදා නිකුත් කරනු ලැබූ අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව ගාල්ල දිස්ත්‍රික්කයට ප්‍රාදේශිය ලේකම් කාර්යාල ලබා දීමත්, නුවරඑළිය දිස්ත්‍රික්කයට උප ප්‍රාදේශිය ලේකම් කාර්යාල ලබා දෙමින් සිදු කළ අවතක්සේරුව සම්බන්ධයෙන් දැනුවත් කිරීමටත්, එම අනීතික ක්‍රියාවලියට විරුද්ධව හඬ නගනු පිණිස සහ නුවරඑළිය ජනයා හට යුක්තිය ලබා ගැනීමටත් ගැසට් පත්‍රයට අනුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල පහ ස්ථාපිත කරන ලෙස ඉල්ලමිනුත්, මලෙයග අරසියල් අරංගම් පසුගිය මාසයක කාලයක් පුරා (දෙසැම්බර් 29 සිට ජනවාරි 31 දක්වා) මහජන පෙත්සම් ව්‍යාපාරයක් දියත් කර, එලෙස ලබාගත් පෙත්සම් දිස්ත්‍රික් ලේකම්වරයා වෙත ලබා දුන්නෙමු.

02. දෙවන අදියර ලෙ 2022 වසරේ පෙබරවාරි මස පළමුවැනිදා මලෙයග අරසියල් අරංගම් වෙනුවෙන් මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ද ගොනු කළෙමු. (පැමිණිල්ලෙහි පිටපත් අමුණා ඇත.)

03. එමෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයට හිමි විය යුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධයෙන් රජය තීන්දු තීරණවලට පිටුපෑමේ ක්‍රමවේදයට විරෝධය පාමින් එය මෙරට ජනතාවගේ අවධානය වෙත රැගෙන ඒම සඳහා උතුරේ සිට දකුණ දක්වා මහජන පෙත්සම් අත්සන් කිරීමේ ව්‍යාපාරයක් මලෙයග අරසියල් අරංගම් විසින් දියත් කර ඇත.

04. මීට අමතර ව පහත සඳහන් ඉල්ලීම් ද මලෙයගා අරසියල් අරංගම් විසින් ඉදිරිපත් කර ඇත. එම සාධනීය ඉල්ලීම්වලට සහය වීම සඳහා මෙම පෙත්සම්ට අත්සන් කරන ලෙස සමකාලීන දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති, සිවිල් සංවිධාන, සමාජ  සංවිධාන සහ මහජනයාගේ මලෙයගා අරසියල් අරංගම් ඉල්ලීමක් කරනු ලබයි.

''ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී 2016 වසරේ සම්මත කළ, 2018 වසරේ දී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලද, 2019 වසරේ ඔක්තෝබර් මස 29 වන දින අතිවිශේෂ ගැසට් පත්‍රයක (2017/24) සඳහන් කළ පරිදි, නුවරඑළිය දිස්ත්‍රික්කයට ප්‍රාදේශීය ලේකම් කාර්යාල ස්ථාපිත නොකළ බව මේ වනවිට පැහැදිලි වී තිබේ. එපමණක් නොව ගාල්ල දිස්ත්‍රික්කයට එක් ආකාරයකිනුත් නුවරඑළිය දිස්ත්‍රික්කයට තවත් ආකාරයකිනුත් රජයේ තීරණය ක්‍රියාත්මක වීම මානව හිමිකම් කඩවීමකි.

''එම නිසා ගැසට් නිවේදනයක සඳහන් කළ පරිදි එම ප්‍රාදේශිය ලේකම් කාර්යාල ගාල්ල දිස්ත්‍රික්කයට මෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයටත් ලබා දෙන ලෙස ඉල්ලමින්, නුවරඑළිය දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මයිල්වාගනම් තිලකරාජාගේ නායකත්වයෙන් මලෙයගා අරසියල් අරංගම් විසින් ක්‍රියාවට නංවා ඇති මහජන පෙත්සමට අත්සන් කර සිය මාගේ සහය ඔවුන්ට ලබා දෙමි.''

තව ද මෙය භාෂා තුනකින් මහජන පෙත්සමක් ලෙස ඔබ වෙත යොමු කරන්නෙමු.

ඔබගේ සංවිධානය මඟින් මහජන පෙත්සම් ජාතික ව්‍යාපාරය ඉදිරියට රැගෙන ගොස් නුවරඑළිය ජනතාවට යුක්තිය ලබා ගැනීමට මානව හිමිකම් කොමිසමට යොමු කර ඇති පැමිණිල්ලට ඔබගේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු.

මෙම ගැටලුව රට තුළ විසඳා ගත යුතු බැවින් මෙය රටෙහි ජනතාව අතර පමණක් ව්‍යාපාරය රැගෙන යාමට කටයුතු කරන්නෙමු.

'උතුරේ සිට දකුණ දක්වා' මහජන පෙත්සම් අත්සන් ගැනීමේ ජාතික ව්‍යාපාරය
දිනය - 12/02/2022 වන සෙනසුරාදා
වේලාව - සවස 2.00 සිට 5.00 දක්වා
ස්ථානය - සමාජය හා සාමයික කේන්ද්‍රය මරදාන (CSR)

ස්තුතියි...

..................................................

මයිල්වාගනම් තිලකරාජා,
ප්‍රධාන සම්බන්ධීකාරක - මලෙයගා අරසියල් අරංගම්
නුවරඑළිය දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

240-1/ඩී, ඇවරියවත්ත පාර, වත්තල, ශ්‍රී ලංකා
ජංගම දුරකතන අංකය - 077 - 7 23 97 65
දුරකතන අංකය - 011 - 29 82 998
විද්‍යුත් තැපැල - thilakmyl@yahoo.co.in

..................................................

ලේකම්
N. ක්‍රිෂ්ණකුමාර්, B.A (Hons), MRDP (Col.)
ජංගම දුරකතන අංකය - +94 77 9 71 91 92
විද්‍යුත් තැපැල - nkrishna05@gmail.com